# සංකේත භාවිතය තුළින් ගැමි සමාජයේ සන්නිවේදනය සිදු වූ ආකාරය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

එස්.බී.පී.යූ.එන්.එස්. බණ්ඩාර[1], ඒ.ඩී.ඒ.පී.ටී.එල්.කේ. ජයරත්න[2]

මානව සංස්කෘතියට අනන්‍ය වූ ලක්ෂණය වන සංකේත සංනිවේදනාර්ථයෙන් මානව සමාජයේ අතීතයේ සිට නූතනය දක්වා විකාශනය දක්වා ඉතාමත් වී ඇත. මානව සංවර්ධනයට මෙන්ම, මානව පැවැත්මට ද, මානව සම්බන්ධතා නිර්මාණය වී ක්‍රියාත්මක වීමට ද සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ. ගැමි සමාජ සංස්කෘතියෙහි සංකේත භාවිත කිරීම මඟින් සන්නිවේදනය පවත්වා ගෙන ගොස් ඇති බව හඳුනාගත හැකිය. ද්විතීය මූලාශ්‍රය භාවිත කරමින් ගැමි සමාජ සංස්කෘතිය තුළ සංකේතානු සාරයෙන් සන්නිවේදනය සිදු වූ ආකාරය මෙමඟින් අධ්‍යයන කරන ලදි. ගැමි සමාජ සංස්කෘතියෙහි පැවති අනබෝල බැඳීම තුළින් ප්‍රකාශ වන්නේ යම් ප්‍රදේශයක් තහනම් බව ප්‍රකාශ කිරීමයි. විශේෂයෙන් වැව්වල කාන්තාවන් ස්නානය කරන ස්ථාන අනෙක් පුද්ගලයන්ට තහනම් බව ප්‍රකාශ කිරීමට මෙය සිදු කරයි. මෙහි දී සිදු කරනුයේ කෝටුවක් අඟට හනස්සක් බැඳීමෙනි. එමෙන්ම කොහොඹ අත්ත ද සාම්ප්‍රදායික ගැමි සමාජ සංස්කෘතිය තුළ සන්නිවේදනයේ දී ප්‍රධාන සංකේතයක් වශයෙන් භාවිත කරයි. එනම් අනතුරු ඇඟවීම සඳහා මෙය යොදා ගනි. කොහොඹ අත්තක් නිවස ඉදිරියේ එල්ලීම මඟින් එම නිවසේ බෝවන රෝගයක් ඇති බව සංකේතවත් කරයි. එය අවබෝධ කරගන්නා ගැමියන් එම නිවසට පැමිණීමෙන් වැලකී සිටි. වියළි කලාපයේ සාම්ප්‍රදායික ගැමි ජනතාව අතර පැවති කුල්ල පේකිරීම මඟින් සිදු කරනුයේ ද සංකේතාත්මක ආකාරයෙන් සන්නිවේදනයකි. ලිංගික සම්බන්ධතා තම නිවස තුළ පවත්වන විට දොරටුව ඉදිරිපසින් කුල්ලක් නවා තැබීම සිදු කරන අතර, එම සංකේතය අවබෝධ කරගන්නා ගැමියන් එම අවස්ථාවේ නිවසට පැමිණීමෙන් වැලකී සිටි. සාම්ප්‍රදායික ගැමි සමාජ සංස්කෘතිය තුළ බුලත් යනු සන්නිවේදනය සිදු කරන තවත් සංකේතයකි. ආරාධනාවලට, සමාව ගැනීමට, මනාලියගේ ශුද්ධ අශුද්ධ භාවය මනාලයාගේ පාර්ශවයට දැනුම් දීම සඳහා බුලත් කනපිට හැරවීම සිදු කරන ලදි. මෙලෙස බුලත් සංකේතයක් වශයෙන් ගැමි සමාජ සංස්කෘතිය තුළ කිසියම් සන්නිවේදනයක් සිදුකළ බව පැහැදිලි වේ. පොල් ගසක මිනිසෙකුගේ උස ප්‍රමාණයට එහි කඳේ ගොක් කොලයක් බැඳීමෙන් සංකේතවත් කරන්නේ එම ගසේ එලදාව දෙවියන්ට බාර කළ බවයි. නිදන පැදුර එළියට දැමීමෙන් ගෙයින් පිටත්වන ලෙස සංකේතවත් කරන අතර මඟුල් රැවුල කැපීමෙන් සංකේතවත් කරන්නේ ලඟදී මනාලියක් නිවසට කැන්දන් එන බවයි. මෙවැනි සන්නිවේදනාර්ථ තුළින් නිගමනය කළ හැක්කේ සාම්ප්‍රදායික ගැමි සමාජ සංස්කෘතිය තුළ සන්නිවේදනය සිදු කිරීම සඳහා විවිධ වූ සංකේතයන් භාවිත කර ඇති බවය.

ප්‍රමුඛ පද : සන්නිවේදනය, සංකේත, සමාජය, සංස්කෘතිය, සම්ප්‍රදාය

[1 2] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. upulnimanthas9596@gmail.com